දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතිය - (2 කොටස) - 2017
-----------------------------------------------------------------

දක්ෂිණ අධිවේගී මාර්ග දිගුව ව්‍යාපෘතියේ - (2 කොටස) 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය, චීන අපනයන ආනයන බැංකුව හා ශ්‍රී ලංකා හැටන් නැෂනල් බැංකුව අතර 2016 අප්‍රේල් 07 දින එළඹි අංක. පීබීසී අංක. (2015) 38 එකතු අංක. (381) හා 2016 ජූනි 06 දිනැති අංක. (3408) දරන ණය ගිවිසුම් සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.

1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය
--------------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුම් අනුව, එවකට උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මාර්ග හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර, මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. මේ වන විට ක්‍රියාත්මක වන දක්ෂිණ අධිවේගී මාර්ගය (කොළඹ සිට මාතර දක්වා) මාතර සිට හම්බන්තොට දක්වා දීර්ඝ කරමින් යෝජිත හම්බන්තොට ජාත්‍යන්තර සංවර්ධන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය, වාණිජ අගනගරය, හම්බන්තොට ජාත්‍යන්තර වරාය සහ ජාත්‍යන්තර ගුවන්තොටුපල (මත්තල) අතර සම්බන්ධයක් ඇති කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. ව්‍යාපෘතියේ 02 වන කොටස යටතේ දක්ෂිණ අධිවේගී මාර්ගය බෙලිඅත්ත සිට වැටිය දක්වා කිලෝමීටර් 26 ක් දීර්ඝ කිරීම සඳහා ඇස්තමේන්තුගත පිරිවැය රු. මිලියන 60,601.60 ක් වූ අතර, එයින් සියට 85 ක් වූ එ.ජ.ඩො. මිලියන 360.29 කට සමාන වූ රු. මිලියන 46,920 ක් සිවිල් හා උපදේශන කටයුතු සඳහා චීනයේ අපනයන ආනයන බැංකුව විසින් ලබා දීමට එකඟ වී තිබුණි. එ.ජ.ඩො. මිලියන 63.58 ක් වූ ඉතිරි සියයට 15 ක ප්‍රමාණය ශ්‍රී ලංකා හැටන් නැෂනල් බැංකුව විසින් මූල්‍යයනය කිරීමට එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ -02 කොටස යටතේ වූ කටයුතු 2016 ඔක්තෝබර් 28 දින ආරම්භ කර තිබුණු අතර 2019 ඔක්තෝබර් 27 දින වන විට අවසන් කිරීමට නියමිතය.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ වගකීම්
--------------------------------------------------

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

1.4 විගණකගේ වගකීම
--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට අනුකූලව මගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැළසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම් පිළිබඳ විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදනම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීමේදී, අවස්ථාවෝචිත උචිත විගණන පරිපාටි සැළසුම්කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම විගණනයට ඇතුලත්වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන

ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දැ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂාවට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කළ ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම් වලට අදාල පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරුවනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම් ව්‍යාපෘතිය විසින් පවත්වාගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ශ්‍රී ලංකා රජය හා ණය සපයනු ලබන නියෝජිත ආයතනයෙන් ලද අරමුදල් වලින් දරන ලද ව්‍යාපෘති වියදම්, මූල්‍ය හා භෞතික වශයෙන් ව්‍යාපෘතියේ ප්‍රගතිය, ව්‍යාපෘතියේ මෙහෙයුම් කටයුතු වලින් උත්ගත වූ වත්කම් සහ වගකීම් හා ණයවලින් කරන ලද මිලදී ගැනීම් හඳුනාගැනීම ආදිය දැක්වෙන පරිදි අඛණ්ඩ පදනමක් මත ප්‍රමාණවත් ගිණුම් වාර්තා පවත්වාගෙනයනු ලැබුවේද යන බව.

(ඈ) ණය යටතේ ආපසු ගැනීම්, ණය ගිවිසුම් වල දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඉ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඊ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණය අනුව වියදම නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(උ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(ඌ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමණාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(එ) ණය ගිවිසුම් වල දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

---------------

### 2.1 මතය

-----

මගේ පරීක්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නා වූ මතය වනුයේ,

(අ) **2017** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා **2017** දෙසැම්බර් **31** දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබූ බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ඍජු ගෙවීම් සඳහා සහාය වීමට ඉදිරිපත් කරන ලද ණය යටතේ ආපසු ගැනීම් අයදුම්පත් මත සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව,

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියා මාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වී තිබුණු බවත්ය.

**3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය**

**3.1 අරමුදල් උපයෝජනය**

සමාලෝචිත වර්ෂය සඳහා සහ 2017 දෙසැම්බර් 31 දක්වා අරමුදල් උපයෝජනය, සමාලෝචිත වර්ෂය සඳහා අයවැයගත ප්‍රතිපාදනය සහ මූල්‍යයනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුමට අනුව මූල්‍යයනය කිරීමට එකඟ වූ මුදල | | 2017 වර්ෂය සඳහා අයවැය ප්‍රතිපාදනය | අරමුදල් උපයෝජනය | |
|---|---|---|---|---|---|
| | | | | 2017 වර්ෂය තුළ | 2017 දෙසැම්බර් 31 දක්වා |
| | එ.ජ.ඩො. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| චීන අපනයන ආනයන බැංකුව | 360.29 | 46,920 | 12,500 | 9,460.84 | 16,635.01 |
| හැටන් නැෂනල් බැංකුව | 63.58 | 8,280 | - | 2,878.79 | 2,878.79 |
| ශ්‍රී ලංකා රජය | - | - | 200 | 709.33 | 1,280.35 |
| ජාතික ඉතිරිකිරීමේ බැංකුව | - | - | - | 283.13 | 320.86 |
| සම්පත් බැංකුව | - | - | - | 177.44 | 177.44 |
| එකතුව | 423.87 | 55,200 | 12,700 | 13,509.53 | 21,292.45 |

**3.2 භෞතික ප්‍රගතිය**

2018 අගෝස්තු 06 දිනැති ව්‍යාපෘති ප්‍රගති වාර්තාවට අනුව, ඉලක්කගත වැඩවල ප්‍රගතිය වූ සියයට 50.89 ට සාපේක්ෂව තථ්‍ය භෞතික ප්‍රගතිය සියයට 46.25 ක් ලෙස පැවතුනි. කෙසේ වෙතත්, ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණු අපේක්ෂිත ඉලක්ක හා සසඳන විට පාලම් සහ අනෙකුත් ව්‍යුහාත්මක කටයුතු වල ඉදිකිරීම් ප්‍රගතිය මන්දගාමී විය.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කොන්ත්‍රාත් පොදු කොන්දේසිවල 14.6 උප වගන්තියට අනුව, කොන්ත්‍රාත්කරු විසින් ඉදිරිපත් කළ යුතු අතුරු ගෙවීම් සහතිකවල අවම වටිනාකම කොන්ත්‍රාත්තුවේ වටිනාකමින් සියයට 1 ක් විය යුතුය. කෙසේ වෙතත්, අවශ්‍ය සීමාවට වඩා අඩු අතුරු ගෙවීම් සහතික ඇගයීම අවස්ථා 6 කදී නිරීක්ෂණය විය.

(ආ) වැඩ කටයුතු ආරම්භ කිරීමට පෙර ඉදිකිරීම් කටයුතු පිළිබඳ සවිස්තරාත්මක අධ්‍යයනයක් සිදු කර නොතිබුණි. 2014 සැප්තැම්බර් මාසයේදී උපදේශකයින් විසින් සාදන ලද මූලික සැලසුම් නිර්මාණ වලට අනුව, ව්‍යාපෘතියේ II වන කොටසේ අධිවේගී මාර්ගයට යටින් ගමන් කිරීමට ඇති පාලම් (Underpasses) 07 ක්, අධිවේගී මාර්ගයට ඉහලින් ගමන් කිරීමට ඇති පාලම් (Overpasses) 05 ක්, පාලම් 15 ක් සහ බෝක්කු 55 ක් ඉදිකිරීමට නියමිත විය. කෙසේ වෙතත්, ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශයන්ගෙන් අනතුරුව, hydraulic අවශ්‍යතාවය මත පදනම්ව ඉදිකිරීම් කටයුතුවල විෂය පථය 2017 මාර්තු මාසයේදී සැලකිය යුතු ලෙස සංශෝධනය කර අධිවේගී මාර්ගයට යටින් ගමන් කිරීමට ඇති පාලම් 26 ක්, අධිවේගී මාර්ගයට ඉහලින් ගමන් කිරීමට ඇති පාලම් 07 ක්, පාලම් 08 ක් සහ බෝක්කු 70 ක් ඉදිකිරීමට තීරණය කර තිබුණි.

(ඇ) කොන්ත්‍රාත්තුවේ පොදු කොන්දේසිවල 4.2 උප වගන්තියට අනුව කොන්ත්‍රාත්තුවේ නිසි ක්‍රියාකාරීත්වය සඳහා කොන්ත්‍රාත්කරු තම වියදමින් කාර්ය සාධන සුරක්ෂණයක් ලබා ගත යුතු වුවද, , නිශ්චිත අගයක් (Provisional Sum) ලෙස අංක 107 (2) දරන විශේෂ ගෙවීම් අයිතමයක් ව්‍යාපෘතිය විසින් ඇතුළත් කර තිබුණු බව නිරීක්ෂණය වූ අතර 2017 දෙසැම්බර් 31 දිනට කාර්ය සාධන සුරක්ෂණ සඳහා කොන්ත්‍රාත්කරුවන්ට රු. මිලියන 209 ක් ගෙවා තිබුණි.